# 68. නලකපාන සූත්‍රය.

1. මා ගේ ඇසීම මෙසේය. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් ජනපදයෙහි නලකපාන නම් ගමේ කැල (එරබදු) වනයෙහි වාසය කළහ. ඒ කාලයෙහි බොහෝ ප්‍රසිද්ධ කුල පුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු වෙත්. ආයුෂ්මත් අනුරුද්ධ, ආයුෂ්මත් නන්දිය, ආයුෂ්මත් කිම්බිල, ආයුෂ්මත් නන්ද, ආයුෂ්මත් කුණ්ඩධාන, ආයුෂ්මත් රේවත, ආයුෂ්මත් ආනන්ද (සහ) වෙනත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ කුලපුත්‍රයෝ වෙත්. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් විසින් පිරිවරන ලද්දේ එළිමහනක වැඩ හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ කුල පුත්‍රයන් අරභයා භික්ෂූන්ට කථාකොට, "මහණෙනි, යම් ඒ කුල පුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම, සස්නෙහි පැවිදිවූවාහුද, මහණෙනි, කිම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි ඇලුනාහුද?" මෙසේ කීකල්හි ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ. දෙවෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ ඒ කුල පුත්‍රයන් අරභයා භික්ෂූන්ට කථාකොට, "මහණෙනි, යම් ඒ කුල පුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම, සස්නෙහි පැවිදිවූවාහුද, මහණෙනි, කිම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි ඇලුනාහුද?" දෙවෙනි වරත් ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ. තුන්වෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ ඒ කුල පුත්‍රයන් උදෙසා භික්ෂූන්ට කථාකොට, "මහණෙනි, යම් ඒ කුල පුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම, සස්නෙහි පැවිදිවූවාහුද, මහණෙනි, කිම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි ඇලුනාහුද?" තුන්වෙනි වරත් ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට, මම ඒ කුල පුත්‍රයන්ගෙන්ම අසන්නෙම් නම් යෙහෙකැයි අදහස් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට කථා කළහ. "අනුරුද්ධයෙනි, කිම තොපි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි ඇලුනාහුද?" "ස්වාමීනි, ඒකාන්තයෙන්ම අපි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි ඇලුනෝ වමු." "අනුරුද්ධයෙනි, යහපත, යහපත, අනුරුද්ධයෙනි තොපි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි කැමතිවන්නහු නම් එය ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිදිවූ තොප වැනි කුලපුත්‍රයන්ට, සුදුසුය. අනුරුද්ධයෙනි, හොඳ තරුණ වයසින් යුත්, ජීවිතයේ මුල් වයසෙහි සිටින්නාවූ, තරුණවූ, කලු කෙස් ඇති යම්බඳු තොපි පංචවිධකම් සැප අනුභව කරන්නට හැකියාව ඇතිමුත්, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහුය, අනුරුද්ධයෙනි, තොපි රජුන්ට බියව පැනගොස් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවැදි වූවාහු නොවෙති, සොරුන්ට බියව පැනගොස් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, ණයහිමියන්ගෙන් පීඩාවී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, බයෙන් පීඩාවී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, ජීවත්වන්ට කළහැකි අන්කිසිවක් නැතිකම නිසා ගිහිගෙන් නික්ම

සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, අනුරුධයෙනි, එතකුදු වුවත්: 'ඉපදීමෙන්, ජරා මරණ දෙකින්, ශෝකයන්ගෙන්, වැලපීම්වලින්, දුක්වලින්, දොම්නස්වලින්, උපායාසයන්ගෙන් යුක්තවූ මෙම ජීවිතයේ යම්, දුකට බැස ගතිම්, දුකින් මඩනා ලද්දෙම්, මේ සියලු දුක් රාශියේ අවසානය දැක්කහොත් යෙහෙකැ' යි, සිතා මෙසේ තොපි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙත්ද?"

"එසේය ස්වාමීනි."

**3.** " යහපත, අනුරුධයෙනි, මෙසේ පැවිදිවූ කුල පුත්‍රයා විසින් කුමක් කළයුතු වන්නේද? අනුරුධයෙනි, කාමයන්ගෙන් හා අකුශල ධර්‍මයන්ගෙන් සිත නොමුදවා පසිඳුරනගෙන් විඳින්නාවූ සැපයකට ඉතා උසස්වූ වෙනස්වූ ප්‍රීති සැපයකට හෝ සිත නොනමා සිටියේද, ඊට වඩා උසස් අනික් සැපයකට නොපැමිණෙයිද, "ලෝභය ඔහුගේ සිත මැඩගෙන සිටියි, ව්‍යාපාදයද ඔහුගේ සිත මැඩගෙන සිටියි, ථීනමිද්ධයද ඔහුගේ සිත මැඩගෙන සිටී, උද්දච්ච කුක්කුච්චයද ඔහුගේ සිත මැඩගෙන සිටී, විචිකිච්ඡාවද ඔහුගේ සිත මැඩගෙන සිටියි, නොඇල්මද ඔහුගේ සිත මැඩගෙන සිටී, අලසකමද ඔහුගේ සිත මැඩගෙන සිටියි. අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශලයන්ගෙන් වෙන්ව ප්‍රීති සැපය හෝ එයින් අන්‍යවූ සැපයක් හෝ නොලබන්නේ නම් මෙසේ වන්නේය.

**4.** "අනුරුධයෙනි, කාමයන්ගෙන් හා අකුශල ධර්‍මයන්ගෙන් සිත මුදව පසිඳුරනගෙන් විඳින්නාවූ සැපයකට ඉතා උසස්වූ වෙනස්වූ ප්‍රීති සැපයකට හෝ සිත නමව, ඊට වඩා උසස් අනික් සැපයකට හෝ පැමිණේද, ඔහුගේ සිත ලෝභයෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත ව්‍යාපාදයෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත ථීනමිධයෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත උද්ධච්ච කුක්කුච්චයෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත විචිකිච්ඡාවෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත නොඇල්මෙන් අල්වාගෙණ නොසිටී, ඔහුගේ සිත අලසබවෙන් අල්වාගෙණ නොසිටී, අනුරුධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්‍මයන්ගෙන් වෙන්වූ ප්‍රීති සැපයට හෝ පැමිණෙයිද, ඊට වඩා උසස් සැපයකට හෝ පැමිණෙයිද ඔහුට මෙසේ වන්නේය.

**6.** " අනුරුධයෙනි, කිමද? තථාගතයන් වහන්සේගේ විසින්, කෙලෙස් වඩන, නැවත ඉපදීමක් ඇතිකරණ, දුක් පීඩා සහිත විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ, ආශ්‍රවයෝ ප්‍රහීණ නොකලායයි සිතත්ද?. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරුකළ යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි." කියා මා කෙරෙහි තොපි මෙසේ සිතව්ද?

**6.** " ස්වාමීනි, අප එසේ නොසිතම්හ කෙලෙස් වඩන, නැවත ඉපදීමක් ඇතිකරණ, දුක් පීඩා සහිත විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ, ආශ්‍රවයෝ ප්‍රහීණ නොකලායයි නොසිතම්හ. තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය

කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරුකල යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි." කියා තථාගතයන් වහන්සේ කෙරෙහි අපට එබඳු සිතක් නැත.

"ස්වාමීනි, කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත, දුක් විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ, යම් ආශ්‍රවයෝ වෙත්ද තථාගතයන් වහන්සේගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීණවූවාහු වෙත්. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරුකල යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි." භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපට මේ අදහස් වන්නේය.

7. "යහපත, අනුරුද්ධයෙනි, යහපත, යහපත, අනුරුද්ධයෙනි, කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත දුක් විපාක ඇති, නැවත ඉපදීම, ජරාව, මරණය ඇතිකරණ, යම් ආශ්‍රවයෝ වූවාහුද, තථාගතයන් වහන්සේගේ (ඒ ආශ්‍රවයෝ) ප්‍රහීණ වූවාහුය. මුළුසුන්කරණ ලද්දාහුය. මස්තකය සිඳි තල් ගසක් මෙන් කරණ ලද්දාහුය. විනාශ කරණ ලද්දාහුය. නැවත ඉපදීම නැතිකරණ ලද්දාහුය. අනුරුද්ධයෙනි, යම්සේ මස්තකය සිඳින ලද තල් ගස නැවත වැඩීමට සුදුසු නොවේද, අනුරුද්ධයෙනි, එමෙන්ම කෙලෙසන නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත දුක් විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ යම් ආශ්‍රවයෝ වෙත්ද (ඒ ආශ්‍රවයෝ) තථාගතයන් වහන්සේ විසින් පහ කරන ලද්දාහුය. මුලුසුන්කරණ ලද්දාහුය. මස්තකය සිඳින තල් වත්තක් මෙන් කරණ ලද්දාහුය. විනාශකරණ ලද්දාහුය. නැවත ඉපදීම නැතිකරණ ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළයුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරු කළ යුතු කොටස දැන දුරු කරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි කියා තථාගතයන් වහන්සේ කෙරෙහි මේ අදහස වන්නේය.

8. "අනුරුද්ධයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? කවර ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් තථාගතයන් වහන්සේ නොපමාවව් මියයන්නට පෙර මෙයට වඩා යහපත් උපතක් සඳහා වෙහෙසෙව් 'අසුවලා මියගොස් අසවල් තැන උපන්නේය, අසුවලා අසවල් තැන උපන්නේය' යි ඉකුත්වූ කාලක්‍රියා කළ ශ්‍රාවකයන් පිලිබඳ උප්පත්තීන් ප්‍රකාශ කරයිද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ආදිකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිට කොට ඇත්තාහ. ස්වාමීනි, මේ කරුණ පිලිබඳ අර්ථය භාග්‍යවතුන් වහන්සේටම වැටහෙන සේක් නම් යහපති. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්" යයි (කීවාහුය.)

“අනුරුධයෙනි, තථාගතයන් වහන්සේ මහජනයා රවටනු පිණිස, මහජනයා පොළඹවනු පිණිස, ලාභ සත්කාර ලබාගනු පිණිස 'මහජනයාගෙන් කීර්තිය දිනනු පිනිස 'අසුවලා අසුවල් තැන උපන්නේය අසුවලා අසවල් තැන උපන්නේය' යි ඉකුත්වූ මැරීගිය ශ්‍රාවකයන් පිලිබඳ උප්පත්තිය ප්‍රකාශ නොකරයි. අනුරුධයෙනි, ශ්‍රද්ධාව ඇති, බොහෝ සතුටු ඇති,

බොහෝ මහත් සතුටු ඇති කුල පුත්‍රයෝ ඇත්තාහුය. ඔවුහු එය අසා ශ්‍රාවක භාවය (පැවිදිබව) පිණිස සිත එලවත්. අනුරුද්ධයෙනි, ඔවුන්ට එය බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වෙයි.

9. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවකගේ අභාවයෙන් පසු ' භාග්‍යවතුන් වහන්සේ විසින් "මෙනම් භික්ෂුව පිරිනිවන් පැවේය. පංච නිවරනයන් සිඳ බිඳලු 'ඒ භික්ෂුව නැවත උපතකට නොපැමිනෙන්යයි රහත් බැව්හි පිහිටියේය' යි ප්‍රකාශ කරණ ලද්දේයයි අසයි. ඒ ආයුෂ්මත්තෙම තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු සිල් ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු ස්වභාව ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු නුවණ ඇත්තෙකැයි කියාද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු හැසුරුම් ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත්තෙම මෙසේ භවයෙන් මිදුනේයයිද, අසන ලද්දේ හෝ වෙහිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහි කරමින් ඒ බව පිණිස තමනගේද සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුවගේ සැප විහරණය වේ.

" අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුව කාම ලෝකය භජනය කරන සංයෝජන පස නැතිකිරීමෙන් ඔපපාතිකව එහි පිරිනිවෙන ස්වභාවය ඇති ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි අසයිද, ඒ භික්ෂුව තමා විසින් දකින ලද්දේ හෝ වෙයිද, 'ඒ ආයුෂ්මත් තෙම මෙබඳු සිල් ඇත්තෙකැයි ඒ ආයුෂ්මත් තෙම මෙබඳු ස්වභාව ඇත්තෙකැයි ඒ ආයුෂ්මත් තෙම මෙසේ භවයෙන් මිදුනේය' යි අසන ලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහි කරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුවට සැප විහරණය වේ.

10. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුව සංයෝජන (භවබන්ධන) තුණක් නැතිකිරීමෙන්, රාග ද්වෙෂ මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක් වරක්ම (උප්පත්ති වශයෙන්) පැමිණ දුක් කෙළවර කරන්නේයයි ප්‍රකාශ කරණ ලද්දේය' යි අසයිද, 'ඒ භික්ෂුව තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු සිල් ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙම මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙමේ මෙබඳු නුවණ ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු හැසුරුම් ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙම මෙසේ භවයෙන් මිදුනේයයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුවට සැප විහරණය වේ.

11. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුව සංයෝජන (භවබන්ධන) තුණක් නැතිකිරීමෙන්, සෝවාන්ව, අපායෙහි උපදින ස්වභාවය නැත්තෙක්ව නියමයෙන්ම නිවන් පිහිටකොට

ඇත්තෙක් වීයයි ප්‍රකාශ කරණ ලද්දේය'යි අසයිද, 'ඒ භික්ෂුව තමන් විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු සිල් ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙමේ මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙමේ මෙබඳු නුවණ ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු හැසුරුම් ඇත්තෙක, ඒ ආයුෂ්මත් තෙමේ මෙසේ භවයෙන් මිදුනේයයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුවට සැප විහරණය වේ.

12. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුණිය රහත් බැව්හි පිහිටියායයි ප්‍රකාශ කරණ ලද්දේයයි, අසයිද, 'ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තිය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තිය. ඒ නැගනිය මෙබඳු හැසුරුම් ඇත්තිය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනියයි' අසන ලද්දී හෝ වෙයිද, ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

13. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය කාම ලොකය භජනය කරණ සංයෝජන පස නැතිකිරීමෙන් ඔපපාතිකව එහි පිරිනිවෙන ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි' ප්‍රකාශ කරණ ලද්දීය, 'ඒ භික්ෂුණිය තමා විසින් දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගණිය 'මෙබඳු සිල් ඇත්තිය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තිය. ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනියයි' අසන ලද්දී හෝ වෙයි, ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

14. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය සංයෝජන (භවබන්ධන) තුණ නැති කිරීමෙන් රාග දෝස මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක් වරක්ම (උප්පත්ති වශයෙන් ) පැමිණ දුක් කෙළවර කරන්නීයයි' ප්‍රකාශ කරණ ලද්දීයයි, අසයිද, 'ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, 'ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තිය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තිය. ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනිය'යි, අසන ලද්දී හෝ වෙයිද, ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

16. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය සංයෝජන (භවබන්ධන) තුණක් නැතිකිරීමෙන්

සෝවාන්ව, සතර අපායෙහි ඉපදීමට නොපැමිණෙන්නියක්ව නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තියක් වීයයි ප්‍රකාශ කරණ ලද්දියයි අසයිද, ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දි හෝ වෙයිද, ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තිය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තිය. ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනියයි අසන ලද්දි හෝ වෙයිද, ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

16. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියාකළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ උපාසකයා කාම ලෝකය භජනය කරන සංයෝජන පස නැතිකිරීමෙන් ඖපපාතිකව එහි පිරිනිවෙන, ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි' අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, 'ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු නුවණ ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු හැසිරීම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේය' යි අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා ඒ උපාසකයා ගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහි කරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාට සැප විහරණය වේ.

17. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසකයා සංයෝජන තුණක් නැතිකිරීමෙන්, රාග, දෝස, මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක්වරක්ම (උප්පත්ති වශයෙන් ) පැමිණ දුක් කෙළවර කරන්නේයයි ප්‍රකාශ කරණ ලද්දේය' යි අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේද, 'ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු නුවණ ඇත්තෙක. ඒ උපාසකයා මෙබඳු හැසුරුම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේයයිද,' අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා ඒ උපාසකයාගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාහට සැප විහරණය වේ.

18. " අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ උපාසකයා සංයෝජන (භවබන්ධන) තුණක් නැතිකිරීමෙන්, සෝවාන්ව, අපාය ලෝකයන්හි ඉපදීමට නොපැමිණෙන්නෙක්ව නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තෙක් වීයයි ප්‍රකාශ කරණ ලද්දේය'යි අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු හැසිරීම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේය' යි අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා ඒ උපාසකයාගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාට සැප විහරණය වේ.

19. " අනුරුධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව කාම ලෝකය හජනය කරණ සංයෝජන පස නැතිකිරීමෙන් ඔපපාතිකව එහි පිරිනිවෙන ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තියයි' ප්‍රකාශ කරණ ලද්දීයයි අසයිද, 'ඒ උපාසිකාව තමා විසින් දක්නා ලද්දී හෝ වෙයිද, 'ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තියයිද, ඒ උපාසිකාව මෙබඳු ස්වභාව ඇත්තියයිද, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තියයිද. ඒ උපාසිකාව මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනියයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසිකාව ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත්කමද, ත්‍යාගය හා ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුධයෙනි, මෙසේද උපාසිකාවට සැප විහරණය වේ.

20. " අනුරුධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව සංයෝජන (භවබන්ධන) තුණ නැතිකිරීමෙන් රාග ද්වෙෂ මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක් වරක්ම (උප්පත්ති වශයෙන් ) පැමිණ දුක් කෙළවර කරන්නීයයි ප්‍රකාශ කරණ ලද්දීය'යි අසයිද, ඒ උපාසිකාව තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනීය'යි අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුධයෙනි, මෙසේද උපාසිකාවට සැප විහරණය වේ.

21. " අනුරුධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව සංයෝජන (භවබන්ධන) තුණක් නැතිකිරීමෙන් සෝවාන්ව, අපාය ලෝකයන්හි ඉපදීමට නොපැමිණෙන්නියක්ව, නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තියක් වීයයි ප්‍රකාශ කරණ ලද්දීය'යි අසයිද, ඒ උපාසිකාව තමා විසින් දක්නා ලද්දී හෝ වෙයිද, 'ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු ස්වභාව ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තිය, ඒ උපාසිකාව මෙබඳු හැසිරීම් ඇත්තිය, ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනියයි අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසිකාව, ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුධයෙනි, මෙසේද උපාසිකාවට සැප විහරණය වේ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙසූ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් අනුරුධ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු විය.

**අටවෙනි වූ නළකපාන සූත්‍රය නිමි. (2 – 8)**